සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත
கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
மேல் மாகாணம்
DEPARTMENT OF ANIMAL PRODUCTION & HEALTH
WESTERN PROVINCE


දුරකථනය / தொலைபேசி / Telephone } 01 - 958474
ෆැක්ස් / பெக்ஸ் / Fax } 01 - 959260

වැලිසර, රාගම, ශ්‍රී ලංකා
வெலிசறை, றாகம, இலங்கை.
Welisara, Ragama, Sri Lanka


මගේ අංකය / எனது இல. / My No. } ..............................
ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................
දිනය / திகதி / Date } ..............................

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව(බ.ප.)

**<u>2020/21 වර්ෂය තුළබස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සඳහා නිමි සත්ව ආහාර (compound animal feed) සැපයීම</u>**

ලංසුකරුගේ/ආයතනයේ නම --------------------------------------
--------------------------------------

ලිපිනය --------------------------------------
--------------------------------------
--------------------------------------
--------------------------------------

දුරකථන අංකය --------------------------------------

ෆැක්ස් අංකය --------------------------------------

ව්‍යාපාර ලියාපදිංචි අංකය --------------------------------------

ෆැක්ස් අංකය - 011-2959260දුරකථන අංක - 011-2967490/, 011-2958474

**<u>2020/2021 වර්ෂය තුළබස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වලදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන හාදෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සඳහා අවශ්‍යනිමි සත්ව ආහාර (compound animal feed) සැපයීමට ලංසු කැඳවීම.</u>**

1. ප්‍රසම්පාදනය පිළිබඳ පොදු කොන්දේසි . "අ" ඇමුණුම

2. ප්‍රසම්පාදන ආකෘති පත්‍රය. "ආ" ඇමුණුම

3. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛණය. "ඇ" ඇමුණුම

4. කොන්ත්‍රාත් ගිවිසුම. "ඈ" ඇමුණුම

**2020/2021 වර්ෂය තුළබස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවවිසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වලදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන හාදෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සඳහා අවශ්‍ය නිමි සත්ව ආහාර (compound animal feed) ප්‍රසම්පාදනය සඳහා පොදු කොන්දේසි**

**01. හැඳින්වීම.**

(අ) 2020/2021 වර්ෂය තුළබස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යදෙපාර්තමේන්තුවවිසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වලදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන හාදෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සඳහා අවශ්‍යනිමි සත්ව ආහාර (compound animal feed) (මෙහි මින් ඉදිරියට සත්ව ආහාර ලෙස දැක්වෙන)සැපයීමසඳහා දෙපාර්තෙමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු කැඳවනු ලැබේ.

(ආ) රාගම වැලිසර පිහිටි සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාරතෙමේන්තුව බස්නාහිර පලාත්කාර්යාලයේ ගිණුම් අංශයෙන් 2020.09.02. වැනිදින සිට 2020.09.15 වැනි දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 ලන්සු පත්‍ර පත්‍ර ලබා ගත හැකිය.

(ඇ) 2020/9/16 දින පෙ.ව. 10.30 ට ලංසු පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීමසිදු කරනු ලබයි.

**02. ප්‍රසම්පාදන ලියවිලි .**

(අ) ප්‍රසම්පාදන ලියවිලි පහත සඳහන් පරිදි විය යුතුය.

1. ප්‍රසම්පාදන ආකෘති පත්‍රය. "ආ" ඇමුණුම
2. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛණය. "ඇ" ඇමුණුම
3. කොන්ත්‍රාත් ගිවිසුම. "ඈ" ඇමුණුම

(ආ) කවර ආකාරයේ හෝ දෝෂ පිළිබඳ සියලු අවධානම් සම්බන්ධයෙන් ලංසුකරුවන්වන් වග කිව යුතු හෙයින් සිය යහපත තකා මෙම ප්‍රසම්පාදනයට අදාළ සියළු කොන්දේසි ගැන දැනුවත් වන ලෙස ලංසුකරුකරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

(ඇ) වැඩිමනත් විස්තර දුරකථන අංක 011-2967490, 011-2958474 සහ ඔස්සේ සත්ව නිෂ්පාදනහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (බ.ප.) පළාත්අධ්‍යක්ෂකගෙන් හෝ ගණකාධිකාරී වෙතින් ලබා ගතහැක.

**03. ලංසුපත් ඉදිරිපත් කිරීම.**

(අ) ජේද 01 "ආ" අනුව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ආකෘති පත්‍ර මගින් පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර සියළුම වෙනස් කිරීම් සහ මකා දැමීම් ලංසුකරු විසින් පුරවා ඇති හෝ ලියා ඇති සහ කෙටි අත්සන යොදා ඇති සියලුම පිටු ඇතුළත්ව ප්‍රසම්පාදන ලියවිලි ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ලංසුකරු විසින් ප්‍රසම්පාදන ආකෘති පත්‍ර වල මුල් පිටපත සහ අනු පිටපත වෙන වෙනම ලියුම් කවර වල බහා සියල්ල එක් ලියුම් කවරයකට ඇතුලත් කර මුද්‍රා තබා ඡේද 3 "ඇ" හෝ 3 "ඉ" වල සදහන් ස්ථානයට සහ එහි සදහන් ආකාරයට තම මිල ගණන්ඉදිරිපත්කළ යුතුය. ලංසු පත් වල මුල් පිටපත සහ අනුපිටපත පැහැදිලිව හදුනා ගත හැකි පරිදි ලියුම් කවරයේ ඉහල කෙලවරේ වෙන වෙනම සදහන් කල යුතුය.ලංසුකරුගේ නමසහ ලිපිනය සෑම ලිපි කවරයකම ඇතුලත් කල යුතු වේ.

(ඇ) 2020/09/16වැනි දින ප ව 10.30 ට පෙර ලැබෙන සේ සභාපති, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,වැලිසර,රාගම යනලිපිනයට ලියාපදිංචි තැපැල මගින් එවිය හැක. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "**<u>2010/21 වර්ෂය තුල සත්ව ආහාර සැපයීම සදහා මිල ගණන්</u>**" යනුවෙන් සදහන් කළ යුතුය.

(ඉ) ලියාපදිංචි තැපැල මගින් මිල ගණන් ඉදිරිපත් නොකරනු ලබන පුද්ගලයන් හා ඔවුන්ගේ ඒජන්තවරු විසින් තමන්ට අදාල මිල ගණන් ඡේදය 3 "ඇ" පරිදි සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තබා ඇති ලංසු පෙට්ටියේ නියමිත දිනට හා වේලාවට ප්‍රථම බහාලිය හැක.

(ඊ) ලංසුකරු වන් විසින් නියමිත පරිදි අත්සන් කරන ලද ප්‍රසම්පාදන මිල ගණන් පහත සදහන් අනුපිළිවෙලට ඉදිරිපත් කල යුතුය.

1. ප්‍රසම්පාදන ආකෘති පත්‍රය. "අ"ඇමුණුම
2. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛණ- සාරාංශ හා විස්තර වාර්තාව. "ආ"ඇමුණුම
3. සත්ව ආහාර සැපයීමට අදාල කොන්ත්‍රාත් ගිවිසුම "ඇ" ඇමුණුම
4. ලංසු සුරක්ෂණ ඇපකරය.
5. සත්ව ආහාර පිරිවිතර සම්බන්ධ සම්පූර්ණ කරන ලද වාර්ථාව "ඇමුණුම"

(උ) ප්‍රසම්පාදන උපලේඛණ වල සිදු කරන සෑම වෙනස් කීරිමක් හා මැකීමක් ඉදිරියෙන් ලංසුකරු විසින් කෙටි අත්සන යෙදිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් එකී ප්‍රසම්පාදන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඌ) ප්‍රසම්පාදන මිල ගණන් පැහැදිලිව ලියා හෝ මුද්‍රණය කොට ඉලක්කමෙන් සහ අකුරෙන් සදහන් කළ යුතුය . ඉලක්කමෙන් සදහන් මිල ගණන් සහ අකුරින් සදහන් මිල ගනන් අතර වෙනසක් ඇතොත් අකුරින් සදහන් මිල ගණන් නිවරැදි සේ පිළිගනු ලැබේ.

(එ) ලංසුකරු විසින් ස්වකිය ලංසු පත්‍රය සමග 2019 වර්ෂය ආසන්න මාස 03 ක් කාලයකට අදාල සිය බැංකු ගිණුමේ සහතික කරන ලද බැංකු ගිණුම් වාර්ථා ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් ද ඉදිරිපත් කල යුතුය.

**04.** ලංසුභාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව.

**(අ)** 2020/09/16 වන දින ප.ව පෙ.ව.10.30 ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුවිවෘත කරනු ලැබේ.

(ආ) ලංසු විවෘත කරනු ලබන වේලාවේදී ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. එම වේලාවේදී පැමිණ සිටින අයට පහත සදහන් තොරතුරුකියවා දෙනු ලැබේ.

1. එක් එක් ලංසු කරුගේ නම සහප්‍රසම්පාදන ආකෘති පත්‍රයේ සදහන් මුදල.
2. ලංසු බැදුම්කරයක් ඉදිරිපත් කර ඇත් ද නැත් ද යන්න සහ ඉදිරිපත් කොට ඇත්නම් එහි සදහන් මුදල.

(ඇ) ලංසුපත් භාරගැනීම අවසන් වූ දිනට සහ වේලාවට පසුව ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කොට විවෘත නොකර ආපසු යවනු ලැබේ.

**05.** **ලංසු බැදුම්කරය.**

(අ) සෑම ලංසුපතක් සමගම රජයේ හෝ පෞද්ගලික බැංකු ආයතනයක් විසින් නිකුත් කරන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත රු. 300,000.00වටිනා බැංකු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. එම ලංසු ඇපකරය 2020/9/15 දින සිට දින 90 ක් වලංගු විය යුතුය.

(ආ) ලංසුපතක් සමග ලංසු බැදුම්කරය ඉදිරිපත් කිරීමට අපොහසත් වන ලංසුකරුගේ මිළගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06.** **කාර්ය සාධන බැදුම්කරය.**

සාර්ථක ප්‍රසම්පාදනකරු විසින් කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම සඳහා පිළිගත් බැංකුවකින් ලබාගත් ඇපයක් වශයෙන් කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් 10% කට සමාන(වාර්ෂික වටිනාකම) වටිනාකමින් කාර්ය සාධන බැදුම්කරය පලාත් අධ්‍යක්ෂ(ස.ප.) නමින් ලංසුකරුගේ ලංසුව පිළිගැනීමේ ලිපියේ දින සිට දින 14 ඇතුලත ඉදිරිපත් කල යුතුය.

**07.** **මිළ ගණන් වල වලංගුභාවය.**

ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද මිළගණන් ස්ථිර විය යුතු අතර ඒවා ලංසු භාර ගැනීම අවසන් කරනු ලැබීමෙන් පසු මිළගණන් වල වෙනස් කිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

**08.** **මිළ ගණන් ඉදිරිපත් කිරීම.**

මිළගණන් ඉදිරිපත් කිරීමේදී එකතුකළ අගය මත බද්ද ඇතුලත් කල හැකිය. මෙහිදී අදාල වන්නේ නම් එකතු කළ අගය මත බදු වටිනාකම මිල උපලේඛණයේ පැහැදිලිව සටහන් කල යුතුය.( එකතු කල අගය මත බදු ලියාපදිංචි අංකයද සඳහන් කරන්න) ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලද මිළගණන් යටතේ වර්ෂයපුරාම සැපයිය යුතු අතර කිසිදු අවස්ථාවකදී මිල වැඩිකිරීමකට අවසර දෙනු නොලැබේ.

**09.** **මිළ උපලේඛණය.**

මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ 'ආ' ඇමුණුමේ සඳහන් උපලේඛණයට අනුකූලවය.**ඔබ විසින් ඉදිරිපත් කරන ලේඛණයක ඉදිරිපත් කරන්නේ නම් දෙපාර්තමේන්තු ආකෘතියට අනුවම සකස්කල එකක් විය යුතුය.**

**10.** ඇගයීම් නිර්නායක.

(අ) ලංසු පරීක්ෂා කිරීමෙන් පසු සුදුසු ලංසු කරුවකු තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් විස්තරාත්මක ඇගයීමක් කරනු ලැබේ.එක් එක් සැපයුම්කරුගේ සැපයුම් කාණ්ඩ ඇගයීමකට ලක් කර රජයට ඉතාමත් වාසිදායක වන ඇගයුම් කරන ලද අවම මිළගණන් ඉදිරිපත් කර ඇති ප්‍රතිචාරාත්මක සැපයුම්කරු තෝරා ගනු ලැබේ.

(ආ) ලැබී ඇති ලංසු සවිස්තරාත්මක ඇගයීමකට ලක්කිරීමට පෙර පහත සඳහන් කරුණු සපුරා ඇත්දැයි යන්න පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කරනු ලැබේ.

1.ලංසු ලේඛණවල සඳහන් සුදුසුකම් ලැබීමේ නිර්ණායක සපුරා ඇත්ද,

2.අවශ්‍ය ලියකියවිලි නිසි ලෙස අත්සන්කොට ඉදිරිපත් කර ඇත්ද,

3.ප්‍රසම්පාදනය සමග අවශ්‍ය දෑ ඉදිරිපත් කර ඇත්ද,
( ලංසු රක්ෂණයද ඇතුළත්ව)

4.ප්‍රසම්පාදන කොන්දේසි පිළිබදව ලංසුකරු ප්‍රමාණවත් ප්‍රතිචාරයක් දක්වා ඇත් ද

(ඇ) තාක්ෂණික ඇගයීම් කමිටුවේ මුලික පරීක්ෂණයෙන් පසුව පහත සදහන් කරුණු සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණයක් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සිදු කරනු ලැබේ.

1.ඒකක මිළ
2.පුර්ව අත්දැකීම් හා කාර්යසාධනය.
3.ව්‍යාපාර ලියාපදිංචිය
4.ගුණාත්මක භාවය සහ ප්‍රමිතීන්ට අනුකුල වීම.
5.ක්ෂෙත්‍ර පශු වෛද්‍ය නිලධාරීන් හෝ ආයතන ප්‍රධානීන් විසින් මින් පෙර සපයා ඇති සත්වආහාර පිළිබද පැමිණිලි
6. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සත්ව ආහාර නිෂ්පාදන ආයතනයක නිෂ්පාදිත සත්ව ආහාර වීම

**11. අසාමාන්‍ය ගාස්තු.**

(අ) යම් සත්ව ආහාරයක් සම්බන්ධයෙන් ලංසුකරු විසින් අසාමාන්‍ය අඩු ගාස්තු ඉදිරිපත් කර ඇත්නම් ලංසුකරු විසින් එම අඩු ගාස්තු මගින් එම කාර්යය සපුරාලන්නේ කෙසේදැයි අදාල ගාස්තු පිළිබද විශ්ලේෂණයක් ද ප්‍රසම්පාදන මණ්ඩල තාක්ෂණික ඇගයීම් කමිටුව සෑහීමකට පත් වන පරිදි ඔප්පු කරන ලෙස ලංසුකරුට දැනුම් දෙනු ලැබේ.

(ආ) මේ සම්බන්ධව කළ පැහැදිලි කිරීම් පිළිගත නොහැකිනම් හා එම ගාස්තු මත ක්‍රියාත්මක වීමෙන් ප්‍රසම්පාදනය අසාර්ථක වන්නේ යැයි ප්‍රසම්පාදන මණ්ඩලයේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ අදහස නම් මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන පැහැදිලි කිරීම් පිළිගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන මණ්ඩලය සෑහීමකට පත් වන්නේ නම් ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කරනු ලැබේ.

**12. ප්‍රසම්පාදනය භාර නොගැනීම සම්බන්ධයෙන් දඩුවම.**

තමන්ට ප්‍රසම්පාදනය භාර දීමට ඇති බවට සදහන් ලිපියේ දින සිට ලිඛිත නිවේදනයක් ලැබී වැඩ කරන දින 14 ක් ඇතුලත ලංසුකරු ගිවිසුමට එළඹීමට ප්‍රතික්ෂේප කලහොත්හෝ පැහැර හැරියහොත් හෝ කාර්යය සාධක ඇපය ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ලංසුකරුගේ ලංසු බැදුම්කරය රාජසන්තක කොට ඔහුගේ නම අසාදු ලේඛණගත කරනු ලැබේ. ලංසුකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිනයට ලියාපදිංචිතැපෑලෙන් ප්‍රසම්පාදනය භාරගත් බවට කෙරෙන දැන්වීමක් ලැබුවා සේ සලකනු ලැබේ.

**13. පැහැර හැරීම**

සැපයුම්කරු විසින් සපයනු ලබන සත්ව ආහාර නිසි වේලාවට භාර නොදෙන්නේ නම් හෝ සත්ත්ව පරිභෝජනයට නුසුදුසු සත්ව ආහාර සපයයි නම් හෝ සපයන ලද සත්ව ආහාර ප්‍රමිතියට වඩාපහළ මට්ටමක තිබේ නම් හෝ කොන්ත්‍රාත්කරු සැපයීම් කිරීමට ක්‍රියාශීලි ලෙස නිරත නොවන්නේ නම් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය මේන්තුවේ අධ්‍යක්ෂවරයාට එකී ක්‍රියාවන්ගෙන් සිදු වන පාඩුව සැපයුම්කරුගෙන් අය කර ගැනීමට හෝ ලංසුව අවලංගුකිරීමට හෝ පුලුවන. කොන්ත්‍රාත් කාලය තුල ඇනවුම් කරන ප්‍රමාණය නොකඩවා සැපයීමට අපොහොසත් වන්නේ නම් ඔබගේ කාර්ය සාධන ඇප සුරක්ෂණය රාජ සන්තක කරනු ලැබේ.

**14.** **ලංසුව පිළිබඳ සලකා බැලීම**

(අ) යම් ලංසුව ක් සම්බන්ධයෙන් මෙහි සඳහන් සියලු කොන්දේසි සපුරාලීමට නොහැකි නම් එම ලංසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) ලංසුව ප්‍රශ්න කිරීමෙන් තොරව මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීමට හෝ යම් කොටසක් පමණක් පිළිගැනීම මිල ගණන් පිළිබඳ සාකච්චා කිරීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ. එවැනි අවස්ථා වල ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසාන තීරණ වේ.

(ඇ) "ආ" ඇමුණුමේ විස්තර කරන සත්ව ආහාර වලින් යම් ප්‍රමාණයක් ඇණවුම් කිරීමේ අයිතිය සත්ත්වනිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ව සතු වේ. ඇ ඇමුණුමේ සඳහන් සත්ව ආහාර වලින් යම් කොටසක් ඇණවුම් කිරීමේදී දෙපාර්තමේන්තුව වෙතින් සිදු වන අත්හැරීමක් හේතු කොට ගෙන ඇති වන හානි සඳහා වන්දි වශයෙන් දෙපාර්තමේන්තුවෙන් හෝ රාජ්‍ය නිලධාරීන්ගෙන් යම් ගෙවීමක් ඉල්ලා සිටීමට කොන්ත්‍රාත්කරුට යම් හිමිකමක් නොමැත.

(ඈ) රජයේ කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ ලේඛණයේ නම සඳහන් තැනැත්තෙකුට ලංසු ඉදිරිපත් කිරීමට හිමිකමක් නොමැත. එවැනි ලංසුවක් සඳහා කොන්ත්‍රාත්තුවකට ඇතුළත් වීමට හිමිකමක් නොමැත.

**15.** **ගිවිසුම .**

(අ) සාර්ථක ලංසුකරු විසින් මෙහි ඇතුළත් ආ ඇමුණුම මගින් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සමග කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

(ආ) සාර්ථක ලංසුකරු විසින් කාර්යය සාධන බැදුම්කරය ඉදිරිපත් කිරීම සහ නියමිත පරිදි ගිවිසුම අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔහු කොන්ත්‍රාත් පැහැර හරින්නෙකු වශයෙන් සලකනු ලබන අතර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා නමට ලබා දුන් ලංසු සුරක්ෂණය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.

**16.** **අතුරු කොන්ත්‍රාත්.**

(අ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා පූර්ව ලිඛිත අනුමැතිය නොලබා කොන්ත්‍රාත්තුව හෝ කොටසක් යම් වෙනත් අයෙකුට පැවරීම හෝ අතුරු බදු දීම නොකල යුතුය.

(ආ) කොන්ත්‍රාත්කරු වෙනුවෙන් කොන්ත්‍රාත් සැපයීම කරගෙන යාම සඳහා යම් තැනැත්තෙකුට බලය පවරමින් කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කරනු ලබන ඇටෝනි බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීම හෝ පිළිගැනිමේ අයිතිය බස්නාහිර පළාත් සභාව සතු වේ.

(ඇ) කොන්ත්‍රාතකරු විසින් අදාල කොන්ත්‍රාත්තුවේ සැපයීම කරගෙන යාම සඳහා රජයේ කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ ලේඛණයේ නම සඳහන් කාණ්ඩය වෙත ඇටෝනි බල පත්‍රයක් නිකුත් නොකල යුතුය.

**17.** **පැහැර හැරීම වෙනුවෙන් මිල දී ගැනීම.**

(අ) තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන් විසින් සපයනු ලබන සත්ව ආහාර ප්‍රමිතීන්ට අනුකූල විය යුතු අතර සත්ව ආහාර භාර ගන්නා නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කිරීමෙන් පසුව සත්ව පරිභෝජනය සඳහා සුදුසු නොවන බව පෙනී ගිය හොත් අදාල නිලධාරියා විසින්එම සත්ව ආහාර ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඇති අතර එම සත්ව ආහාර නියමිත පිරිවිතරයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව නැවත සැපයීම කොන්ත්‍රාත්කරු විසින් කල යුතුය.

(ආ) ඇණවුම් කරන ලද සත්ව ආහාර නියමිත වේලාවට සැපයීම හෝ නියම කරන ලද කාල වකවානුව තුළ ප්‍රතික්ෂේපිත සත්ව ආහාර වෙනුවෙන් ප්‍රතිසම්පාදන සත්ව ආහාර සැපයීමටකොන්ත්‍රාත්කරු අපොහොසත් වන්නේ නම් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යදෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා තමාට සුදුසු යැයි හැගෙන ආයතනයකින්

සත්ව ආහාර වල මිල ගණන් ගැන නොතකා සැපයීම පැහැර හරින ලද සත්ව ආහාර වලට සමාන ද්‍රව්‍ය මිල දී ගැනීමේ අයිතියක් තිබේ.

**18. කොන්දේසි.**

(අ) ඇණවුම ලිඛිතව සකස් කළ යුතුය.අවශ්‍යතාවය අනුව සත්ව ආහාර වරින් වර ඇණවුම් කරනු ලැබේ.සෑම ඇණවුමක්ම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හෝ නියෝජිතයකු විසින් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබේ.පත් කරගන්නා ලද ලංසුකරු ඇණවුම් කරන ලද සත්ව ආහාර ඇණවුම් කරන නිලධාරියා නියම කරන සැපයීම සඳහා සුදානම්ව සිටිය යුතුය.

(ආ) ඇණවුම් කරනු ලබන සත්ව ආහාර කොටදෙණියාව සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය වෙත කාර්යාල වේලාව තුල ගෙනවිත් භාරදිය යුතුය.

(ඇ) සපයනු ලබන සත්ව ආහාර ඉතා හොඳ තත්ත්වයෙන් තිබිය යුතු අතර කල් ඉකුත් වන දිනය සපයන දින සිට ඉදිරියට අවම වශයෙන් දින 45 වත් තිබිය යුතුය.
සත්ව ආහාර ප්‍රවාහනයේදී හා සපයන තෙක්ගබඩා කිරීමේදී අවශ්‍ය නියමිත තත්වයෙන් නඩත්තු කල යුතුය.(ආලෝකය, උෂ්ණත්වය,තෙතමනය,ආදිය) සපයනු ලබන සත්ව ආහාර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වරයා විසින් හෝ ඔහුගේ අනුයෝජකයින් විසින් පරීක්ෂාවට භාජනය කොට අනුමත කරනු ලැබේ.කොන්ත්‍රාත්තුවේ ප්‍රමිතීන්ට අනුකුල නොවන ද්‍රව්‍ය ප්‍රතික්ෂේප කරනු ලබන අතර කොන්ත්‍රාත්කරුගේ වියදමින් ඒවා ඉවත් කරගත යුතුය.

(ඈ) සත්ව ආහාර ඇනවුම් කර ඇති පරිදි සැපයිය යුතුය.ඇනවුම් කරන සත්ව ආහාර ප්‍රමාණයදෙපාර්තමේන්තුවේ මූලා ප්‍රතිපාදන අනුව වෙනස් විය හැකිය.

(ඉ) සපයනු ලබන සත්ව ආහාර සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සත්ව ආහාර නිෂ්පාදන ආයතනයකින් නිෂ්පාදනය කල සත්ව ආහාර විය යුතුය.

(ඊ) සත්ව ආහාර සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එම සත්ව ආහාර වල අඩංගු පෝෂක, ඒවා අඩංගු ප්‍රමාන, භාවිතා කල හැකි සත්ව විශේෂ ආදිය දැක්වෙන සත්ව ආහාර නිෂ්පාදකයා විසින් නිකුත් කල පත්‍රිකාවක් ප්‍රසම්පාදන ලියවිලි වලට අමුණා එවීම අත්‍යවශ්‍ය වේ.

(උ) ගිවිසුම් කාලය මුළුල්ලේම කොන්ත්‍රාත්කරු සත්ව ආහාර සැපයීමට ගිවිසගත් සත්ව ආහාර නිෂ්පාදන ආයතනයේ නිෂ්පාදිත සත්ව ආහාර සැපයීම කල යුතුය.

(ඌ) ගිවිසුම් කාලය තුල ගිවිස ගත් සත්ව ආහාර සැපයීමට ගිවිසගත් නිෂ්පාදන ආයතනය වසා දැමීම, වැඩවර්ජන වැනි හේතූන් නිසා එම නිෂ්පාදන ආයතනයේ සැපයුම් ඇණහිටීම වැනි අනපේක්ෂිත අවස්ථාවන්හිදී පළාත් අධ්‍යක්ෂ (ඛ.ප.) විසින් නියම කරනු ලබන නිෂ්පාදන ආයතනයක සත්ව ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

**19. ප්‍රමාණාත්මක අලාභ.**

කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වන කාලය තුල ඉල්ලා ඇති සත්ව ආහාර නිසි වේලාවට සැපයීමට අපොහොසත් වුවහොත් හෝ ගුණාත්මක බවින් අඩු හෝ අවස්ථාවක කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාණය කල අලාභ සඳහා අධිභාරයක් අය කර ගැනීමට කොන්ත්‍රාත්කරු ගිවිසුමට ඇතුළත් වේ . සපයනු ලබන යම් සත්ව ආහාරප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් සහ එදින නියමිත වේලාවට සැපයීම නොකල හොත් ද්‍රව්‍ය වටිනාකම සහ 10% අධිභාරයකට යටත් කළ හැකිය.

**20. පාලනයෙන් බැහැරව සිදු වන ක්‍රියා**

කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වන කාලයේ දී දෙවියන්ගේ ක්‍රියාවන් ලෙස ගැනෙන හෝ පාලනයෙන් බැහැර ක්‍රියාවක් ලෙස ගැනෙන යුද කැළඹීම , වැඩ වර්ජන, සේවයෙන්

පිටමන් කිරීම, වසංගත රෝග, භූ චලන ගිනි කඳු හා ජල ගැලීම් හෝ වෙනත් බාධා හේතු කොට ගෙන ලංසුකරුට සිදු විය හැකි යම් අලාභයක් සම්බන්ධයෙන් රජයේ පාර්ශවය වෙත කිසිදු වගකීමක් හෝ බැඳීමක් නොමැත.

**21. ශ්‍රී ලංකා නීතිය.**

මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රතිඵලයක් නිසා අත්කරගනු ලබන යම් කොන්ත්‍රාත් ගිවිසුම් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජන රජයේ නීතිය මගින් පාලනය වන ඊට අනුව අර්ථකතනය විය යුතුය.

**22.** ලංසුකරු ප්‍රසම්පාදනයේ කොන්දේසි පිළිබඳ ව සපුරා දැන සිටිය යුතුය. කවර අවස්ථාවක වත් තොරතුරු නොලැබීම ගැන හෝ ඌණ තොරතුරු පිළිබඳ කෙරෙන ආයාචනා භාර ගනු නොලැබේ .

**23.** බේරුම් කිරීම පිලිබඳ තීරණය ගනු ලබන්නේ 1995 අංක 11 දරණ බේරුම් කිරීමේ පනත අනුවය.

**24. වැඩි විස්තර .**

තෝරාගනු ලැබු ලංසුකරු ලංසුඇප මුදල ගෙවීම් පැහැර හැරියොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ලංසුව පිළිගත් බවට කරන ලිපියේ දින සිට දින 14 ක් තුලදී යම් ලංසු ලේඛණයක යම් නිවැරදි කිරීමක් හෝ සංශෝධනයක් කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලා සිටින විට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පලාත් අධ්‍යක්ෂ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමට අපොහසත් වුවහොත් හෝ ලිඛිත දැන්වීම ලැබී දින 14 ක් ඇතුලදී ගිවිසුම අත්සන් කිරීම සඳහා පලාත් අධ්‍යක්ෂ කාරයාලයට වාර්තා කිරීමට අපොහොසත් වන්නේ නම් සත්ව ආහාර සපයා ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ගයක් ගැනීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පලාත් අධ්‍යක්ෂ වරයාට බලයක් ඇත.මෙම කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත් බැඳීම් නොතකා හැරීම හේතුවෙන් දැරීමට සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් සඳහාද මුදල් අයකරනු ලැබේ.එවැනි අවස්ථාවකදී ලංසුකරු විසින් මෙම ලංසුව සඳහා තබන ලද ක්‍රියාකාරි ඇපකරය රාජසන්තක කොට ලංසුකරුගේ නම අසාදු ලේඛණ ගත කරනු ලැබේ.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
සත්ත්ව නිෂ්පාදන හාසෞඛ්‍ය දෙපාර්තමේන්තුව
වැලිසර රාගම

ඇමුණුම "ආ"

**ප්‍රසම්පාදන ආකෘති පත්‍රය.**

**<u>2020/21 වර්ෂය තුළබස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවවිසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වලදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන හා දෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සදහා අවශ්‍ය නිමි සත්ව ආහාර (compound animal feed) සැපයීම</u>**

-----------------------------------------------------------------යනස්ථානයේ පදිංචි මෙහි

මින් මතු ලංසුකරු යයි හදුන්වනු ලබන මම/අපි---------------------දින---------------------පුවත්පතේ පල කර තිබූ දැන්වීම් ප්‍රකාර මෙහි පහත සදහන් නියමයන් කොන්දේසි සහ ගිවිස ගැනිම් මත මෙහි සදහන් කරනු ලබනමිළ ගණන් යටතේ සත්ව ආහාර සැපයීම සදහා මෙම ලංසුව ඉදිරිපත්කරමි/කරමු.

01.2020/21 වර්ෂය තුල සත්ව ආහාර සැපයීම සදහාසම්පූර්ණ මිළ ගණන රුපියල්-------------------
(අකුරින් රුපියල්-------------------------------------------------------------------------------)
වැට්බදු රහිත වන අතර වැට්බදුසහිත මුදල රුපියල්---------------------------------------
(අකුරින් රුපියල්-------------------------------------------------------------------------------)

02.මෙම ලංසුව පිළිගනු ලැබුවහොත් ලංසුවට අදාල විස්තර ප්‍රකාශයෙහි සදහන් නියමයන් කොන්දේසි මෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පලාත් අධ්‍යක්ෂ වරයා විසින් නිකුත් කරනු ලබනකොන්දේසිවල(මෙහි"අ" ඇමුණුම වශයෙන් මීට අමුණා ඇති)ඇති නියමයන්ද සාමුහිකවත් වෙන්වෙන්වත් ඉටුකිරීමට ශ්‍රී ලංකා ප්‍රජාත්‍රානන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සමග නීත්‍යානුකුලව ගිවිසගන්නා අතර කොන්ත්‍රාත්තුවේ කාර්යයන් කරගෙන යාම සදහා ක්‍රියාකාරීඇපකරය මගින්ශ්‍රී ලංකා ආණ්ඩුව සමග නීත්‍යානුකුලව බැදෙන්නෙමි/බැදෙන්නෙමු.

03.තවද ලංසුව පිළිගනු ලැබුවහොත් ලංසුව පිලිගත් බව මා වෙත දැනුම් දුන් දින සිට ක්‍රියාත්මක වන පරිදි මීට අමුණා ඇති එකී විස්තර ප්‍රකාශයෙහි සදහන් නියමයන් කොන්දේසි හා ගිවිසගැනීම් වලින්බැදීසිටීමට එකඟවන අතර එකී විස්තර ප්‍රකාශයෙහි මෙන්ම අනෙක් පොදු කොන්දේසිවල සදහන් නියමයන් හා කොන්දේසි වලටද එකඟවන්නෙමි/එකඟවන්නෙමු.

04. උප ලේඛනයේ සදහන් අයිතම, නිසි ප්‍රමිතියෙන් හා නියමිත කල් ඉකුත් කාලය සහිතව සැපයීමට එකඟ වෙමි.

05.මාගේ/අපගේ අනන්‍යතාවය තහවුරු කිරීම සදහා පහත සදහන් ඇමුණුම් අඩංගු ලංසු ලේඛණ කට්ටලය අත්සන් කොට ඇත.

ලංසු ලේඛන කට්ටලය

1. ප්‍රසම්පාදනය පිලිබද පොදු කොන්දේසි "අ" ඇමුණුම

11.ප්‍රසම්පාදන ආකෘති පත්‍රය "ආ" ඇමුණුම

111. ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිල උපලේඛණය "ඇ"ඇමුණුම

සඨග සත්ව ආහාරවලට අදාළ සම්පූර්ණ කරන ලද පිරිවිතර පත්‍රය ඇමුණුම ෂ

නම/සමාගම.------------------------------------------------------------------------------------

ලිපිනය. ------------------------------------------------------------------------------------

දුරකථන අංකය.--------------------------------------- ෆැක්ස් අංකය---------------------------

වැට් ලියාපදංචි අංකය--------------------------------- ව්‍යාපාර ලියාපදිංචි----------------------

-------------------------------------------

ලංසුකරුගේ අත්සන සහ නිල මුද්‍රාව

සාක්ෂිකරුගේ අත්සන -------------------------------------------------------------

සාක්ෂිකරුගේ නම සහ ලිපිනය -------------------------------------------------------

ඇමුණුම"ඇ"

**කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය (බ.ප.)**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව(බ.ප.)**

**2020/2021 වර්ෂය තුළබස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවවිසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වලදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන හා දෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සඳහා අවශ්‍ය**
**නිමි සත්ව ආහාර (compound animal feed) සැපයීම**

**ඇස්තමේන්තු ප්‍රමාණයන් සහ මිළ උපලේඛනය.**

ඉලක්කමින් රු.        අකුරින් රු.

ලංසු වටිනාකම=---------------------- ------------------------------------

වැට් බදු ප්‍රමාණය=--------------------- -------------------------------------

මුළු වටිනාකම =--------------------- -------------------------------------

ලංසුකරු/ආයතනයේ නම=----------------------------------------------------

ලංසු ආයතනයේ ලිපිනය=-----------------------------------------------------

---------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------

වැට් බදු ලියාපදිංචි අංකය=-------------------------------------------------

ව්‍යාපාර ලියාපදිංචි අංකය=--------------------------------------------------

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

-----------------------------------------------------

ලංසුකරු/ආයතන ප්‍රධානියාගේ අත්සන        ආයතනයේ නිල මුද්‍රව.

**සාක්ෂි-**

නම සහ ලිපිනය .        අත්සන.

1.----------------------------------------------------- ------------------------

2.------------------------------------------------------ -------------------------

ඇමුණුම“ඇ”

මිල උපලේඛණය

| අයිතමය | විස්තරය - සත්ව ආහාර වර්ගය | ප්‍රමානය (කි.ග්‍රෑ.) | VAT රහිත වට්ටම් සහිත ඒකකයක මිල | NBT සහ වෙනත් බදු | VAT | මුළු අගය (බදු, වට්ටම් සහිත) |
|---|---|---|---|---|---|---|
| 1 | වසු පැටවුන්ගේ ආහාර (Calfstarter) | 3104 | | | | |
| 2 | නැම්බියන්ගේ ආහාර (Heifermeal) | 7894 | | | | |
| 3 | එළදෙනුන්ගේ ආහාර (Dairy/cattlemeal) | 54156 | | | | |
| 4 | Chick mash (Layer Breeder) කුකුළු පැටවුන්ගේ ආහාර (අභිජනන බිත්තර දමන කිකිලියන් සඳහා) | 1290 | | | | |
| 5 | Grower mash (Layer Breeder) වර්ධනය වන කිකිලියන්ගේ ආහාර ( අභිජනන බිත්තර දමන කිකිකිලයන් සඳහා) | 4251 | | | | |
| 6 | Layer Mash (Layer Breeder) බිත්තර දමන කිකිලියන්ගේ ආහාර (අභිජනන බිත්තර දමන කිකිලියන් සඳහා) | 33471 | | | | |
| 7 | Poultry Grower Mash (වර්ධනය වන කිකිලියන්ගේ ආහාර) | 13275 | | | | |
| 8 | Poultry Layer Mash (බිත්තර දමන කිකිලියන්ගේ ආහාර) | 28262 | | | | |
| 9 | Poultry Chick Mash (කුකුළු පැටවුන්ගේ ආහාර) | 66534 | | | | |
| 10 | Boar Feed (පට්ටි ඌරන්ගේ ආහාර සලාකය) | 10800 | | | | |
| 11 | Sow Feed (අභිජනන ඊරියන්ගේ ආහාර) | 18000 | | | | |
| 12 | Creep Feed (ඌරුපැටවුන්ගේ ආහාර) | 63000 | | | | |
| 13 | Pig Grower Feed (වර්ධනය වන ඌරුන්ගේ ආහාර) | 25200 | | | | |

වගකීම් කාලය:
ඇණවුමේ දින සිට සත්ව ආහාර සැපයීමට ගතවන කාළය:

**<u>2020/21 වර්ෂය තුළ බස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවවිසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වලදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන හා දෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සදහා අවශ්‍ය නිමි සත්ව ආහාර (compound animal feed) වලට අදාල පිරිවිතර</u>**

**ඇමුණුම I**

ඇමුණුම "ඇ"

**2021/21 වර්ෂය තුළබස්නාහිර පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවවිසින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති වලදී ප්‍රතිලාභීන් වෙත ලබාදීමට අවශ්‍ය හා දෙපාර්තමේන්තුව යටතේ වූ ආයතන සඳහා අවශ්‍ය**

**නිමි සත්ව ආහාර (compound animal feed)**

**සැපයීමේකොන්ත්‍රාත් ගිවිසුම.**

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රානන්ත්‍රික සමාජවාදී ජනරජයේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මෙහි මින් මතු අධ්‍යක්ෂ වශයෙන් හඳුන්වනු ලබන අය) හෝ එම තනතුරට පත්වන වෙනත් අධ්‍යක්ෂවරයකු හෝ මෙම ගිවිසුමේ පළමු පාර්ශ්වකරු ලෙස හා ----------------------------------හෝ ඔහුගේ /තත්වයට පත්වන මෙහි මින් මතු කොන්ත්‍රාත්කරු ලෙස හැඳින්වෙන අය දෙවැනි පාර්ශ්වකරු ලෙස වැලිසර දි වර්ෂ 2020 ---------------------දින පහත සඳහන් කරුණු මත ඇතුලත් වන ගිවිසුමේ වග නම්

1. අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ලංසු පත්‍රය සමග අමුණා ඇති විස්තරයේ ඇතුලත් කර ඇති පරිදි කලින් කලට ලිඛිතව දන්වා සිටින පරිදි කොන්ත්‍රාත්කරු විසින් වර්ෂ 2020-------------දින සිට 2021-----------------දින දක්වා අදාල සත්ව ආහාර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (බප) වෙත සැපයිය යුතු වේ.

2.ප්‍රසම්පාදනයේ නියමිත කාල සීමාව තුල නිසි ක්‍රියා මාර්ගයන් ගෙන අවශ්‍යතාවයන් සපුරාලීමට කොන්ත්‍රාත්කරු එකඟ වන අතර එකග වූ පරිදි සපුරනු නොලබන අවශ්‍යතාවයන් සඳහා ගෙවීම් කිරීමට ද එකඟවේ.එම නිසා කොන්ත්‍රාත්කරු විසින් රු.----------------- ක් බැංකු ඇපකරයක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (බප) නමින් ඉදිරිපත් කිරීමට එකඟවේ. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන මෙම තැන්පතුව ආරක්ෂක අරමුදලක් සේ සැලකේ. මෙම ගිවිසුමේ අන්තර්ගත කොන්දේසි ඉහත සඳහන් කොන්ත්‍රාත්කරුගෙන් කඩ වූ අවස්ථාවක ශ්‍රී ලංකා ප්‍රජාත්‍රානන්ත්‍රික සමාජවාදී ජනරජයට එවැනි පාඩුවක් වූ අවස්ථාවකඅයකර ගැනීම සඳහා වේ.

3. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (බප) විසින් පිළිගන්වන ලංසුවේ සඳහන් පරිදි මිළ ගණන් අනුව අත්සන් කරන ලද ඇණවුම් හා ලැබීම් වවුචර් පාදක කරගෙන සකසනු ලබන වවුචර් පත්‍ර ලැබීමෙන් දින 45 ක කාලයක් තුලදී චෙක්පත් මගින් කොන්ත්‍රාත්කරුවෙත ගෙවීම් කරනු ලැබේ.කිනම් මුදල් වර්ෂයකදී හෝ එම මුදල් වර්ෂය තුල සපයන ලද ද්‍රව්‍ය සඳහා (නියමිත කාලයේ දී ඉදිරිපත් නොකළ එවැනි ඉල්ලීම්) ගැන දෙසැම්බර් 31 න් පසු ඉදිරිපත් කරන බිල්පත්‍ර සඳහා ගෙවීම් කරනු නොලැබේ.

4. කොන්ත්‍රාත්කරු වෙත යොමු කරන ලද ඔහු විසින් සපයන ලද ඇණවුම් වල කුමන හෝ දෙයක් අධ්‍යක්ෂ හෝ ඔහු විසින් එසේ කරන ලෙස බලය පවරන ලද ඔහුගේ නිලධාරියකු විසින් ප්‍රමාණයෙන් හා අවශ්‍ය තත්වයට ප්‍රමිතීන්ට නො ගැලපෙන නිසා ප්‍රතික්ෂේප වී දින 07ක් ඇතුලත ඊට අදාල නිවැරදි සත්ව ආහාර සැපයීමට පොරොන්දු වේ.

5.1 වන ඡේදයේ හා 4 වන ඡේදයේ සඳහන් පරිදි කරන ලද නියමිත වේලාවන්ට සැපයීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් අධ්‍යක්ෂතුමා සිතන පරිදි යෝග්‍ය නම් එවැනි මිළකට එවැනි කුමන ස්ථානයකින් හෝ එවැනි සත්ව ආහාර මිළදී ගැනීමට අධ්‍යක්ෂතුමාට නිදහස ඇත. එවැනි මිළ දී ගැනීම් සඳහා හෝ ඒ සඳහා වන ප්‍රවාහනය කිරීමට හා සැපයුම ප්‍රමාද වීම නිසා අවශ්‍ය මුදල අධ්‍යක්ෂතුමා විසින් ඉල්ලා සිටි විටකදි කොන්ත්‍රාත්කරු එවැනි වැඩිපුර ගෙවීමට සිදු වූ වියදම් ආපසු අධ්‍යක්ෂකට ගෙවීමට එකඟ වේ.

6.මෙම කොන්ත්‍රාත්තුව යටතේ කොන්ත්‍රාත්කරුට ගෙවීමට ඇති යම් මුදලක් හා වෙනත් කොන්ත්‍රාත්තුවකින් හා/හෝ ඔහුට අනාගතයේදී ගෙවීමට ඇති ඔහුට අයත් මුදලකින් හා/හෝ සුදුසු යැයි යන වෙනත් ක්‍රමයකින් කොන්ත්‍රාත්කරු විසින් ගෙවීමට ඇති ඕනෑම මුදල් ප්‍රමාණයක් අධ්‍යක්ෂවරයාට අයකර ගැනීමට හැකි බවට එකග වේ.

7.ඉහත 1හා 4 ඡේදයේ නියමිත කාල සීමාව තුල ඇණවුම් කරන ලද සත්ව ආහාර දෙවතාවකට හෝ ඊට වැඩි වතාවලදී සැපයීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වන්නේ නම් මෙම කොන්ත්‍රාත්තුවේ සඳහන් බැදීම් වලට කොන්ත්‍රාත්කරු අපොහොසත් වී යැයි සලකා ඔහු විසින් තැන්පත් කරන ලද රුපියල් ------------------------ කාර්ය සාධන සුරක්ෂණය අහිමි කරනු ඇත.

8. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ගෙන් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව මෙම කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු වෙත පැවරී ඇති බලතල හෝ වගකීම් වෙනත් පුද්ගලයකුට පැවරීම ,මාරු කිරීම හෝ බදු දීම නොකළ යුතු වේ. කොන්ත්‍රාත්කරු මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව ඇටෝනි බලය ශ්‍රී ලංකා ප්‍රජාත්‍රානන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් අසාදු ලේඛණගත කරනු ලැබූ පුද්ගලයෙකුට පැවරිය යුතු නොවේ.මෙම කොන්ත්‍රාත්තුවේ සඳහන් කර ඇති ඕනෑම කොන්දේසියක් කඩ කිරීමේ ප්‍රතිඵලය වන්නේ කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කර ඇති කාර්ය සාධන ඇපකරය අය කර ගැනීම වේ .

9. කොන්ත්‍රාත්කරු ශ්‍රී ලාංකිකයන් පමණක් සේවයේ යෙදවිය යුතුය. අධ්‍යක්ෂතුමා විරෝධය පාන කිසිම අයෙකු කොන්ත්‍රාත්කරු විසින් මෙම කටයුතු සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු නොමැතිව සේවයේ යෙදවිය යුතු නොවේ . ඉහත සඳහන් ශ්‍රී ලාංකිකයන් වන්නේ උපතින් ශ්‍රී ලාංකියෙකු හෝ ලියාපදිංචි ශ්‍රී ලාංකිකයෙකි.

10. මෙහි විස්තරයේ දක්වා ඇති පරිදි ඉල්ලා ඇති සම්පූර්ණ සත්ව ආහාර ප්‍රමාණය ඉල්ලා සිටීමට අධ්‍යක්ෂවරයා හෝ ඔහු වෙනුවෙන් වැඩ බලන අයෙකු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් අනිවාර්යෙන් කල යුතු නොවේ . එම නිසා කොන්ත්‍රාත්කරුට අධ්‍යක්ෂවරයා හෝ ශ්‍රී ලංකා සමාජවාදී ජන රජයෙන් කිසියම් සත්ව ආහාර ප්‍රමාණයක් නොඉල්ලා සිටීමෙන් අධ්‍යක්ෂවරයා හෝ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයෙන් හෝ අලාභ ඉල්ලීමට හිමිකමක් නැත.

11. කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ කටයුතු වලට සේවයේ යොදවා සිටින කිනම් සේවකයෙකුගෙන් විරුද්ධව ඉදිරිපත් වන කම්කරු වන්දි හා / හෝ ඒ වෙනුවෙන් පනවා ඇති මාරු කිරීම් හා වෙනස් කම් සම්බන්ධ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජන රජය නිදහස් කල යුතු වේ.

12. වරින් වර අවශ්‍යතාවය පරිදි ඇණවුම් කරනු ලබන ප්‍රමාණය අඩු වැඩි කිරීමේ බලය අධ්‍යක්ෂ සතු වේ. ලංසු කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් යටතේ වර්ෂය පුරාම සැපයිය යුතු අතර කිසිදු අවස්ථාවකදී මිල වැඩිවැඩිවීමකට අවසර දෙනු නොලැබේ .

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වරින්වර පවත්වනු ලබන රෙගුලාසි මත ගෙවිය යුතු වන සියලු බදු ගෙවීමට කොන්ත්‍රාත්කරු යටත් වනු ලැබේ. ලංසු පෝරමයේ සඳහන් කොන්දේසි සියල්ලම මෙම ගිවිසුමේ කොන්දේසි ලෙස සලකනු ලැබේ. කෙසේ වෙතත් එකී ලංසු කොන්දේසි පත්‍රිකාවේ යම් වගන්තියක් මෙම ගිවිසුමේ යම් වගන්තියක් හෝ වගන්ති සමග ගැටෙන්නේ නම් එකී වගන්තිය හෝ වගන්ති වලින් අධ්‍යක්ෂකට වඩාත් වාසිදායක වගන්තිය බලාත්මක වගන්තිය ලෙස පිළිගනු ලැබේ. මෙහි සඳහන් කොට ඇත්තා වූ කොන්දේසි වලින් ආවරණය නොවන යම් කරුණක් වේ නම අධ්‍යක්ෂකගේ අභිමතය පරිදි ක්‍රියා කරනු ලැබේ.

13.කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති ඔහුගේ. . . . . . . . .. . . . . . . . .. . . . . . . . . .. . . . . . . . .. . . . . . . . .. . . . . . . . . .. . . . . . . . .. . . . . . . . .. . . . . . . . .. . . . . . . . .. . . . . . . . .. . . . . . . . . දරණ ස්ථානයෙහි පිහිටි කාර්යයාලයට සැපයීම සඳහා කරන ඇණවුම් හා/ හෝ කොන්ත්‍රාත්තුව සම්බන්ධ දැන්වීම් යොමු කල යුතු බවට කොන්ත්‍රාත්කරු හා අධ්‍යක්ෂ යන දෙපාර්ශවයම එකග වේ . කොන්ත්‍රාත්කරුගේ කාර්යාල ලිපිනයේ කිසියම් වෙනසක් සිදු වුව හොත් එය අධ්‍යක්ෂට දැන්විය යුතු අතර එවැනි දැන්වීමක් කරන තෙක් ඇණවුම හා වෙනත් දැන්වීම් අධ්‍යක්ෂ ලග ඇති ලිපිනයට යැවීම එම ලිපි / ලැබීඇති බවට ප්‍රමානවත් සාක්ෂියක් ලෙස සැලකේ. පහත සඳහන් ස්ථානයන්හි හා දිනයන්හි දෙපක්ෂයම එකඟව සඳහන් කරන ලද සාක්ෂිකරුවන් ඉදිරිපිටදී මෙම ගිවිසුම අත්සන් කරන ලදී.

.............................................

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂගේ අත්සන

වැලිසර සහ නිල මුද්‍රාව

පනවනු ලබූ කොන්දේසි වලට අනුකූලවමෙම ගිවිසුමේ කාර්යයන් ඉටු කිරීමට එකගවෙමි.

............................................

කොන්ත්‍රාත්කරුගේ අත්සන

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ නිල මුද්‍රාව

වැලිසර.

2020---------මස---------------වැනි දිනදීය.

සාක්ෂිකරුවන්

නම සහ ලිපිනයන් අත්සන

1.---------------------------------------------------------------- -------------------------

2.-------------------------------------------------------------------------------------